විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2015

මගේ අංකය - විවැ/චක්‍රලේඛ2015
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2015.07 .15

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්,
පළාත් සභාවන්හි ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානින්,
දිස්ත්‍රික් ලේකම්වරුන් /ත්‍රිවිධ හමුදා පතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම**

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීමේ අරමුණින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු සඳහා නව ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම 2015.08.01 සිට සෘජුවම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමට තීරණය කර ඇත.

02. විශ්‍රාම වැටුප් ලබමින් සිටින දායකයෙකු මියගිය විට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ඉල්ලුම් පත්‍රය **(ආකෘතිපත්‍ර)** අන්තර්ජාලය භාවිතා කර තොරතුරු ලබා දීමෙන් අනතුරුව පහත සඳහන් ලියවිලි ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. **(සිවිල් විශ්‍රාම වැටුප් ගොනුව සමඟ එවිය යුතු අතර සිවිල් විශ්‍රාම වැටුප් ගොනුව නොමැති අවස්ථාවන් වලදී ගෙවීම් විස්තර ඇතුලත් තාවකාලික ගොනුවක් එවිය යුතුය)**

I. මරණ සහතිකයේ සහතික කල පිටපත
II. විවාහ සහතිකයේ සහතික කල පිටපත
III. අවුරුදු 26 ට අඩු දරුවන්ගේ උප්පැන්න සහතික
IV. වැන්දඹු අනත්දරු අංකය (82/83)
V. ජාතික හැඳුනුම්පතේ සහතික කල පිටපතක්
VI. බැංකු පාස්පොතේ සහතික කල පිටපතක්
VII. පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායා රූපයක්

03. සේවයේ යෙදී සිටියදී මිය යන/ සේවය හැර යාම/ වැඩ තහනම් කිරීමට ලක්වන නිලධාරීන් හා නිලධාරිනියන්ගේ කලත්‍රයන් සඳහා වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පහත සඳහන් ලේඛණ සේවය කළ ආයතනය මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

I. පොදු 55
II. චර්යා සටහන
III. වි.වැ. 16 (මු.රෙ. 1729)
IV. වැන්දඹු අනත්දරු අංකය (82/83) වැන්දඹු අනත්දරු අංකයක් ලබා නොමැති නම් ඊට අදාළ ලේඛණ එවිය යුතුය.
IV. හිමිකම් පිළිබඳ ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ වාර්තාව
V. අනත්දරුවන්ගේ ගිණුම් අංක
VI. ඉහත අංක 02 හි සඳහන් ලේඛණ

04. මෙම චක්‍රලේඛ ප්‍රකාරව වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය 2015.08.01 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඔබ විසින් මේ වන විටත් මවෙතින් ඉල්ලුම් කර ඇති වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු ලිපිගොනු සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව කඩිනමින් මා වෙත තොරතුරු වාර්තා කළ යුතුය.

05. නව ප්‍රදාන පත්‍ර නිකුත් කිරීමේදී නව අංක ක්‍රමයක්ද හඳුන්වා දීමට කටයුතු කර ඇත. මෙමඟින් අපේක්ෂා කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් එකම අංකය නිකුත් කිරීම වලක්වාලීමත්, අභ්‍යන්තර පරීක්ෂාවන් වලදී මතුවන ගැටළු මගහරවා ගැනීමත් වේ.

06. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී යම් ගැටළුකාරී තත්ත්වයක් මතු වුවහොත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කල යුතු අතර විමසීම් කල යුතු දුරකථන අංක පහත දැක්වේ.

| | |
|---|---|
| අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ) | - 011 2209803 |
| සහකාර අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ) | - 0112329557 |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | - 0112209848 |

07. දැනට ක්‍රියාත්මක වන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේදී පවතින දුෂ්කරතා මග හරවා ගැනීම හා කලත්‍රයන් වෙත විධිමත් ලෙස ප්‍රතිලාභ හිමිගැන්වීමේ අරමුණින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම කඩිනම් කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ලෙස මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කෙරේ.

එස්.එස්.හෙට්ටිආරච්චි

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
3. ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම පිණිස
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම පිණිස
5. විගණකාධිපති - කාරුණික දැන ගැනීම පිණිස

පොදු PD/ 04

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10.

# වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරුගේ මුලකුරු සහිත නම

(ග්‍රාම නිළධාරී හා ප්‍රාදේශීය ලේකම් සහතික කල පාස්පෝර්ට් ප්‍රමාණයෙහි වර්ණ ජායාරූපය අමුණන්න)

2. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම
(ජාතික හැඳුනුම්පතෙහි පරිදි)

3. ජාතික හැඳුනුම්පත් අංකය

(ජාතික හැඳුනුම්පතෙහි ග්‍රාම නිළධාරී හා ප්‍රාදේශීය ලේකම් සහතික කල ජයාපිටපතක් අමුණන්න)

4. දායකයාගේ සම්පූර්ණ නම

5. දායකයා සමඟ විවාහ වූ දිනය

එම විවාහයෙන් උපන් දරුවන්ගේ විස්තර

| දරුවාගේ නම | උපන් දිනය | අබාධිත දරුවෙක්ද? (ඔව්/නැත) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

Not In Use

6. i. පෙර විවාහ තිබිණි නම් පමණක් එම විවාහ අවසන් වූ ආකාරය දක්වන්න.
(දික්කසාදයේ නියත තීන්දුව,මරණ සහතික අමුණන්න)

ii. පෙර විවාහයෙන් උපන් දරුවන්ගේ විස්තර

| දරුවාගේ නම | උපන් දිනය | අබාධිත දරුවෙක්ද? (ඔව්/නැත) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

7. 7 හා 8 සඳහා අදාල වේ.
- අබාධිත දරුවෙක් සිටීනම් සෞඛ්‍ය 307 වාර්තාව හා තැපැල්පත් ප්‍රමාණයෙහි වර්ණ ඡයාරූපය අමුණන්න)
- ආබාධිත බව සනාථ කෙරෙන වෛද්‍ය සහතික තිබේ නම් අමුණන්න. ගෙවීම් කිරීම සඳහ අවුරුදු 26 ට පෙර ලබාගත් වාර්තා පමණක් වලංගුවේ.

8. වයස අවුරුදු 18ට අඩු දරුවන් සිටීනම් හෝ අබාධිත දරුවන් සිටී නම් පත් කළයුතු භාරකරුවන්ගේ විස්තර

| නම | ජාතික හැඳුනුම්පත් අංකය | ඥාතීත්වය/සම්බන්ධතාව) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

9. වැන්දඹුව නම් කිහිපයක් භාවිතා කලේ නම් එම නම් පහත දක්වන්න.

I. සම්පූර්ණ නම :- ……………………………………………………………………

II. සම්පූර්ණ නම :- ……………………………………………………………………

III. සම්පූර්ණ නම :- ……………………………………………………………………

(මෙම නම් භාවිතා කළ බවට දිවුරුම් ප්‍රකාශයක් අමුණන්න)

(කලත්‍රයාගේ/ දායකයාගේ/ දායිකාවගේ නම්වල වෙනස්කම් පවතින අවස්ථා වලදී ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකරන ලද විධිමත් පරීක්ෂණයක් මඟින් එකී නම් වලින් හඳුන්වන්නේ එකම අයෙකුද යන්න තහවුරු කර එවන්න)

Not In Use

10. ඉල්ලුම්කරුගේ බැංකු ගිණුම් විස්තර

i. බැංකුවේ නම
ii. බැංකු ශාඛාව
iii. බැංකු ගිණුම් අංකය

විශ්‍රාම වැටුප ඉහත සඳහන් බැංකු ගිණුමට බැර කරන ලෙස ඉල්ලමි.
(බැංකු ගිණුමේහි ඉතිරි පිටුවෙහි පැහැදිලි ඡායා පිටපතක් විවැනි හෝ ග්‍රා/නි විසින් සහතික කර අමුණන්න)

------------------------------------

ඉල්ලුම්කරුගේ අත්සන

---

*** විශ්‍රාම වැටුප් ලැබූ දායකයන් සඳහා පමණක් සම්පූර්ණ කළ යුතුයි.

**ග්‍රාම නිළධාරී සහතිකය.**

ඉහත ඉල්ලුම් කාර්ය සපයන ලද තොරතුරු සත්‍ය බවට සෑහීමකට පත්විය හැකි අතර වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප හිමිකම ඉල්ලුම්කාරියට ලබාදීම නිර්දේශ කරමි.

------------------------------------

ග්‍රාම නිළධාරී අත්සන

---

**විශ්‍රාම වැටුප් නිළධාරී සහතිකය**

ඉහත සඳහන් තොරතුරු විශ්‍රාම ගොනුව අනුව නිවැරදි බවත්,

I. දායකයා අවසන් විශ්‍රාම වැටුප ලැබූ දිනය ------------------------------------
II. අවසන් වරට ගෙවූ වැටුප ------------------------------------

------------------------------------

වි.වැ.නි අත්සන
නම සහිත නිලමුද්‍රාව

Not In Use

## ප්‍රාදේශීය ලේකම් සහතිකය

ඉහත සඳහන් කළ තොරතුරු පිළිබඳව සෑහීමකට පත්විය හැකි අතර ඉල්ලුම්කරු වන -------------------

------------------------------------------------------- ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීමට නිර්දේශ කරමි.

-----------------------------------

ප්‍රාදේශීය ලේකම් අත්සන
නම සහිත නිලමුද්‍රාව

---

***** සේවයේ යෙදී සිටියදී මියගිය දායකයන් සඳහා සම්පූර්ණ කළ යුතුයි.**

------------------------------------------------ මයා/මිය ------------------------------------------------ දින මිය යන තෙක්ම ------------------------------------------------ සේවය කළ බවත් ඔහු/ඇය වෙනුවෙන් කලත්‍රයා වන ------------------------------------------------ ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට නිර්දේශ කරමි.

තවද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සැකසීමට අවශ්‍ය දින තෙක් සම්පූර්ණ කරන ලද වර්යා සටහනෙහි සහතික කරන ලද පිටපතක්ද මේ සමඟ එවමි.

-----------------------------------

ආයතන ප්‍රධානියාගේ අත්සන
නම සහිත නිලමුද්‍රාව

Not In Use